# ස්ත්‍රීත්වය පිළිබඳ බ්‍රාහ්මණ දෘෂ්ටිය පසුකාලීන ආගම් කෙරෙහි කළ බලපෑම

ඇඹිලිපිටියේ සාරද හිමි[1]

බ්‍රාහ්මණ යන්න බ්‍රහ්මණ් යන්නෙන් බිඳී ආ වචනයකි. බ්‍රහ්මන් යන්න ශුද්ධ වාක්‍ය හෝ යැදීම යනාදී අර්ථයෙන් ඉදිරි පත් වේ. එමඟින් මේ වචනය බිඳී ඇත. ලෝකයෙහි සිටින දෙවර්ගයක දෙවිවරුන් අතර දෙ වැනි දෙවිවරු මොවුහු ය. "ද්වයා වෛදේවා දේවාඃ අහෛව දේවා අථයෙ බ්‍රාහ්මණාඃ....." (ශතපථ බ්‍රාහ්මණ 11-26) මහා බ්‍රහ්මයාගේ මුවින් බමුණන් බිහි වී ඇත. ("බ්‍රාහ්මණෝස්‍යාසය මුඛමාසීද්" - ඍග්වේදය) සියලු අධිකාරී බලය ද ඔවුන් සතු ව පැවතිණි. විශ්වේතෘගේ ශරීරයෙහි එක් අර්ධයකින් කාන්තාවගේ උත්පත්තිය සිදු වී ඇත. ඒ බව මනුස්මෘතිය සාක්ෂි දරයි. "අර්ධේන නාරිං තස්‍යාං ස විරාජමසෘජත් ප්‍රභුඃ" කාන්තාව නිතොර රැකවරණයෙන් යුතු ව විසිය යුතු බව මනුස්මෘතිය දක්වයි. "පිතා රක්ෂති කෞමාරේ භර්තා රක්ෂති යෞවනේ - රක්ෂන්ති ස්ථවිරේ පුත්‍රා න ස්ත්‍රී ස්වාතන්ත්‍ර්‍යමර්හති". ස්ත්‍රියගේ අයහපත් ස්වභාවය පිළිබඳ විමසීමේ දී පඤ්චතන්ත්‍රය මෙසේ කරුණු ගෙනහැර දක්වයි. "අනෘතං සාහසං මායා මූර්ඛත්ව මතිලෝභතා - අශෞචං නිර්දයත්වංච ස්ත්‍රීණාං දෝෂාඃ ස්වභාවජාඃ" (පං. මි. 207) "බොරු කීම ද සාහසිකත්වය ද මායාව ද මෝඩකම ද අධික ලෝභය ද අපවිත්‍රත්වය ද දයා රහිත බව ද කාන්තාවගේ ස්වාභාවික දෝෂය යි." ගින්න දරවලින් සතුටු නො වේ. මහ සයුර ගංගාවලින් සතුටු නො වේ. යමයා සියලු සත්ත්වයන්ගෙන් සතුටු නො වේ. කාන්තාව පුරුෂයන්ගෙන් සතුටු නො වේ. (පං. මි.) එසේ ම මරණයේ දොරටු හතර අතර ද එක් දොරටුවක් ලෙසින් කාන්තාව කෙරෙහි විශ්වාසය යන්න දක්වා ඇත. ඒ බව "අනුචිතකාර්යආරම්භඃ ස්වජනවිරෝධෝ - බලීයසී ස්පර්ධා ප්‍රමදා ජන විශ්වාසෝ මෘත්‍යෝර්ද්වාරානි චත්වාරි" ස්ත්‍රියගේ යහපත් ගතිගුණ පිළිබඳ වත් මෙහි දී කරුණු දක්වා ඇත. එනම් "අනර්පිත්වාන් මනුෂ්‍යාණාන් භයාත්පරිජනස්‍යච - මර්යාදායා මමර්යාදාඃ ස්ත්‍රියස්තිෂ්ඨන්ති සර්වදා" - පං. මි. 153. (මිනිසුන් නොපතන බැවින් ද, පිරිවර ජනයාට බියෙන් ද සීමාවක් නැති ස්ත්‍රීහු කුලධර්ම පාලනයෙහි හැම කල්හි සිටිත්.) ඉහත දැක්වෙන කරුණුවල බලපෑම විවිධ ආගම් විෂයයෙහිත් පවතින අයුරු දැක්විය හැකි ය. බෞද්ධ දර්ශනයට අදාළ ව කාන්තාවන්ට පැවිද්ද ලබා දීමේ පුවත ද භික්ෂූන් වසන ප්‍රදේශයෙහි ම භික්ෂුණීන් විසිය යුතු බව ද දැක්වෙනුයේ බ්‍රාහ්මණ ධර්මවල දැක්වෙන පුරුෂයා යටතේ ස්ත්‍රිය සිටිය යුතු අයුරු බලපෑම් සහිත ව පෙන්වාදෙමිනි. පංචතන්ත්‍රයේ මිත්‍රභේදය, හිතෝපදේශයේ සුහෘද්භේදය හා මනුස්මෘතිය යන ග්‍රන්ථ උපයෝගී කරගනිමින් ඉහත ප්‍රස්තුතය පිළිබඳ ව බැලීමේ දී පැහැදිලි වනුයේ කාන්තාව පිළිබඳ බමුණු මතය බොහෝ සෙයින් ශුභවාදී නො වන බව යි.

**ප්‍රමුඛ පදඃ** ආගමික බලපෑම, බ්‍රාහ්මණ, ස්ත්‍රීත්වය, දෘෂ්ටිය, බමුණු මතය

[1] සංස්කෘත අධ්‍යයන අංශය